# සක් දෙවිඳුන්ගේ නළලේ සරල රේඛා ඇඳීම

ග්‍රීක රූපික ස්වසිද්ධිමූලක (ස්වසිද්ධාත්මක යන්නට දර්ශනයෙහි යෙදෙන්නේ ස්වසිද්ධිමූලක යන වචනයයි. මින් පසු අපි ස්වසිද්ධිමූලක යන්න ඇක්සියොමැටික් යන වචනය සඳහා යොදා ගනිමු.) දැනුම් පද්ධති ද්විකෝටික න්‍යාය තුළ ඇති බව කලින් සඳහන් කර ඇත. මෙහි යම් පටු බවක් තිබුණ ද, ග්‍රීකයන් අත මේ න්‍යාය හා රූපික ස්වසිද්ධාත්මක දැනුම ඉහළ තලයකට වර්ධනය විය. මෙහි දී රූපිකවාදයට විශාල මෙහෙයක් ඉටු කළ ප්ලේටෝ නම් දාර්ශනිකයාගේ නම සඳහන් නොකර ම බැරි ය. ඔහු අතින් වර්ධනය වූයේ විඥානවාදය (අයිඩියලිසම්) යැයි හැඳින්වෙන දර්ශනයක් බව සැබෑ ය. එහෙත් ඔහු බටහිර දර්ශනයේ වර්ධනයට උපකාරී වූ පඬුවෙක් විය.

ග්‍රීක චින්තනයෙහි තිබූ රූපික ස්වසිද්ධිමූලක ද්විකෝටික ක්‍රමය තුළට වෙනත් දැනුම් පද්ධතීන් අවශෝෂණය කිරීමෙන් ඒ දැනුම් ක්‍රමානුකූලව සකස් කිරීමට ග්‍රීකයන්ට හැකි වූ බව මගේ විශ්වාසයයි. එහෙත් ඔවුහු එපමණකින් නොනැවතුණහ. ඔවුහු අළුත් දැනුම් ද නිර්මාණය කළහ. මෙහි දී ග්‍රීකයන්ට වියුක්ත (ඇබ්ස්ට්‍රැක්ට්) ව සිතීමට තිබූ හැකියාව ද වැදගත් විය. ග්‍රීකයන් මේ වියුක්ත ව සිතීම ලබා ගන්නට ඇත්තේ යුදෙව්වන්ගෙන් යැයි මම සිතමි. යුදෙව් චින්තනයේ ප්‍රධානම අංගයක් වනුයේ වියුක්තයයි.

සිංහල අප බොහෝ වෙලාවට සිතන්නේ සංයුක්ත (කොන්ක්‍රීට්) ව ය. අපේ සංස්කෘතියෙහි වියුක්ත ව සිතීමට අනුබලයක් නොලැබෙයි. වියුක්ත හා සංයුක්ත යනුවෙන් කියැවෙන්නේ කුමක්දැයි අපි පළමුව සලකා බලමු. වියුක්ත හා සංයුක්ත වශයෙන් අවසානයේ දී වර්ගීකරණය කෙරෙන්නේ දැනුම ය. එනම් සංකල්ප, ප්‍රවාද, ප්‍රමේය ආදිය ය. අපේ දැනුම අවසාන වශයෙන් ගත් කල මනසෙහි නිර්මාණයකි. මනසෙන් තොරව දැනුමක් නැත. අපේ දැනුම යනු අප විසින් නිර්මාණය කරන ලෝක බැවින් මේ ලෝක ද අපේ මනස්වල ම නිර්මාණ වෙයි. (වැඩි විස්තර දැන ගැනීම සඳහා මගේ ලෝකය කියවන්න.) මෙයින් කියැවෙන්නේ මගේ දැනුම මගේ මනසෙහි නිර්මාණයක් බව ය. එමෙන් ම ඔබේ දැනුම ඔබේ මනසේ නිර්මාණයක් වෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ මා සම්බන්ධයෙන් ගත් කල ඇත්තේ මගේ මනස පමණක් බව හෝ ඔබ සම්බන්ධයෙන් ගත් කල ඇත්තේ ඔබේ මනස පමණක් බව හෝ යන්න නොවේ. මගේ හෝ ඔබේ හෝ මනස් ද නැත! මනස ද මනසේ ම නිර්මාණයකි. මගේ මනස මෙන් ම ඔබේ මනස ද මනස්ගාත පමණකි. මනස විසින් මනස නිර්මාණය කෙරෙන්නේ කෙසේදැයි දැන ගැනීම සඳහා පසුගිය ඔක්තෝම්බර් මස 20 වැනි දා ඉරිදා දිවයිනෙහි පළ වූ සිංහල බෞද්ධ මනස නම් මාතෘකාවෙන් වූ ලිපිය කියවන්න.

ඉහත සඳහන් කරුණු නොතේරෙන්නේ නම් ඒ ගැන කලබල විය යුතු නොවේ. නැවත නැවතත් කියවීමෙන් හා වෙනත් ලිපි ද කියවීමෙන් ඒ ගැන අවබෝධයක් ලැබෙනු ඇත. දැනට දැනුම යන්න මනස නැතිව නොපවතින බව තේරුම් ගැනීම ප්‍රමාණවත් වෙයි. දැනුම මනසෙහි නිර්මාණයක් වුවත් මනස දැනුම නිර්මාණය කරන්නේ බොහෝ විට වෙනත් ඉන්ද්‍රියවල ද ආධාරයෙනි. මෙහි දී කිව යුතු වැදගත් කරුණක් වෙයි. බටහිර දර්ශනයෙහි මනස ඉන්ද්‍රියක් ලෙස නොගැනෙයි. එහෙත් පෙරදිග දර්ශනවල, විශේෂයෙන් ම නොයෙකුත් බෞද්ධ දර්ශනවල මනස ද ඉන්ද්‍රියක් ලෙස සැලකෙයි. බෞද්ධ දර්ශනවල මනස ඉන්ද්‍රියක් මෙන් ම සංකල්ප නිර්මාණය කරන්නා ද වෙයි.

අපි සංකල්ප සඳහා උදාහරණයක් සඳහා මල යන සංකල්පය ගනිමු. මලකට පැහැයක් ඇත; සුවඳක් ඇත; මල සිනිඳුය ආදී වශයෙන් අපි කියමු. මලකට පැහැයක් ඇත ආදී වශයෙන් කීව ද අප මල ලෙස සලකන්නේ මේ පැහැයෙහි, සුවඳෙහි, සියුම් බවෙහි ආදී දැයෙහි එකතුවට ය. අප දකින්නේ කහ පාට මලක් යැයි සිතමු. මේ කහ පාට යන්න මනසෙහි නිර්මාණයකි. එහෙත් මනස එය නිර්මාණය කරන්නේ ඇසේ ද උපකාරයෙනි. ඇස නැතිව මනසට පමණක් කහ පාට යන්න නිර්මාණය කර හඳුනාගත හැකි නොවේ. කහ පාට යන්න, එනම් කහ පාට නම් දැනුම ඇති වීම සඳහා මනස මෙන් ම ඇස ද අවශ්‍ය වෙයි. කහ පාට මල යන්න සංයුක්ත සංකල්පයකි. සංයුක්ත සංකල්ප සඳහා මනස මෙන් ම වෙනත් ඉන්ද්‍රියක් හෝ ඉන්ද්‍රිය අවශ්‍ය වෙයි. (කැමරාවකට ඇසක් තිබිණ ද මනසක් නැත. එබැවින් කෙතරම් කිරණ කැමරාවේ කාචය ඔස්සේ ගිය ද කැමරාවට කහ පාටක හැඟීමක් පවා නැත.) වෙනත් වචනවලින් කිවහොත් මනසේ හා වෙනත් ඉන්ද්‍රියවල එකතුවෙන් සංයුක්ත සංකල්ප නිර්මාණය කෙරෙයි.

© Prof. Nalin De Silva

මලක් අප අබියස නැති විටක පවා අවශ්‍ය නම් මනසට මලක් ගැන සිතිය හැකි ය. එනම් මනසෙහි මලක චිත්ත රූපයක් මවා ගත හැකි ය. අප අබියස නොමැති අපේ මිතුරු මිතුරියන්ගේ රූප අපේ මනසෙහි වෙයි. මෙවැනි අවස්ථාවල දී අප කරන්නේ චිත්ත රූප මවා ගැනීමකි. මෙහි දී ඇස නමැති ඉන්ද්‍රියේ ඍජු ආධාරයක් නැතිව ද අපට චිත්ත රූප නිර්මාණය කර ගත හැක. ඇස ආධාර කර නොගත්ත ද ඇස මෙහි දී පසෙකින් ඇතිවාක් මෙන් අපට හැඟෙයි. මෙලෙස වෙනත් ඉන්ද්‍රියක් නොමැති බවක් හැඟුණ ද මෙහි දී සිදුවන්නේ එක්තරා ආකාරයකට ගතහොත් මතකය අවදි කර ගැනීමකි. මතකයෙහි මනස හා ඇස එක් වී නිර්මාණය කරන ලද කහ පාට මල වෙයි. එනම් කහ පාට මලෙහි චිත්ත රූපය වෙයි. මෙලෙස මවා ගන්නා කහ පාට මල වුවද සංයුක්ත සංකල්පයක් වෙයි. එය නිර්මාණයෙහි දී වක්‍රව හෝ ඇස ආධාර වී ඇත.

අපි දැන් දිව්‍ය ලෝකය ගැන සිතමු. දිව්‍ය ලෝකයෙහි අප කලින් භවයක සිටීමට හැකි වුවත් අපට පියවි සිහියෙන් සිටින විට ඒ පිළිබඳ මතකයක් නැත. එහෙත් අපට දිව්‍ය ලෝකය ගැන චිත්ත රූපයක් මවා ගත හැකි ය. ඒ අප දිව්‍ය ලෝකය ගැන අසා ඇති කතා ඇසුරෙනි. සක් දෙවිඳුන් පඬු ඇඹුල් අසුනේ අසුන් දරා සිටිනු අපට සිතෙන් මවා ගත හැකි ය. මා මවා ගන්නා සක් දෙවිඳු ඔබ මවා ගන්නා සක් දෙවිඳු නොවේ. මගේ සක් දෙවිඳු සමහර විට ඔබේ සක් දෙවිඳුට වඩා මහත වීමට ඉඩ තිබේ. ඒ කෙසේ වෙතත් මේ සක් දෙවිඳු ගැන චිත්‍රයක්, එනම් චිත්ත රූපයක් අපට වෙයි. ඒ චිත්ත රූපය ද අප මවා ගන්නේ ඇස ආධාර කර ගනිමිනි. අප කරන්නේ අප ඇසෙන් දැක ඇති රූප ඇසුරෙන් චිත්ත රූපයක් මවා ගැනීම ය. සක් දෙවිඳු ද සංයුක්ත සංකල්පයක් වෙයි.

ඔබ ඇබ්ස්ට්‍රැක්ට් ආර්ට් (වියුක්ත කලා) නමින් හැඳින්වෙන චිත්‍ර දැක ඇතැයි සිතමි. මේ චිත්‍රයක සමහර විට මිනිසකුගේ ඇස ලකුණු කරන්නේ බඩෙහි ය. නහය පාදයෙහි ය. මේවා නමින් වියුක්ත වුව ද චිත්‍රයක් ලෙස ගත්කල මෙහි ඇති වියුක්ත බවක් නැත. අපට චිත්‍රය ඇස්වලින් පෙනෙයි. චිත්‍ර ශිල්පියාට ද එය ඇස්වලින් පෙනෙයි. චිත්‍රයට නැඟීමට පෙර චිත්‍ර ශිල්පියාට ඒ චිත්ත රූපය තිබෙන්නට ඇත. වැඩිම වුවහොත් මෙහි ඇත්තේ චිත්‍ර ශිල්පියාට ඇති වූ යම් වියුක්ත අදහසක් සංයුක්තව සංකේතාත්මක ව චිත්‍රයෙන් ප්‍රකාශ කිරීමක් පමණකි. මිනිසුන් ලෝකය දකින්නේ ඇස්වලින් නොව බඩ ආධාර කරගෙන යැයි කීම සමහර විට චිත්‍ර ශිල්පියාගේ අදහස වුවා විය හැකි ය. බඩ වඩා ගැනීම සඳහා පමණක් විවිධ දේ කරන, විවිධ අයුරින් ලෝකය අර්ථ කථනය කරන මිනිසුන්ගේ ඇස් ඇත්තේ බඩේ යැයි චිත්‍ර ශිල්පියකුට සිතුණහොත් එවැන්නන් බඩේ ඇස් ඇති මිනිසුන් (අවශ්‍ය නම් ඔවුන්ට බඩැසුන් යැයි කිව හැකි ය. එහි ප්‍රථමා විභක්ති ඒක වචනය බඩැසා ද ප්‍රථමා විභක්ති බහු වචනය බඩැස්සු ද වෙයි.) ලෙස නිර්මාණය කෙරෙනවා විය හැකි ය. එහෙත් එය පවා වියුක්ත සංකල්පයක් යැයි කිව හැකි නොවේ. එය සංයුක්ත සංකල්පයක් සාමාන්‍ය වචනයෙන් නැතිව සංකේතාත්මක ව චිත්‍රයකින් (චිත්ත රූපයකින්) නිරූපණය කිරීමකි. ඊනියා වියුක්ත චිත්‍ර සඳහා විවිධ පුද්ගලයන් විවිධ අර්ථ කථන කරනු වැළැක්විය හැකි නොවේ.

අපි දැන් යුක්ලීඩීය ජ්‍යාමිතියෙහි සරල රේඛාව යන සංකල්පය ගනිමු. යුක්ලීඩීය ජ්‍යාමිතියෙහි කියැවෙන ආකාරයට සරල රේඛාවකට දිගක් තිබුණ ද, පළලක් හෝ ඝනකමක් නැත. එසේ නම් අපට සරල රේඛාවක් කඩදාසියක ඇඳිය නොහැකි ය. කෙතරම් සිහින් තුඩක් සහිත පැන්සලකින් ඇන්දේ වී නමුත් එසේ අඳින රේඛාවකට පළලක් (ඝනකමක් ඇත.) පළලක් (ඝනකමක්) නැති රේඛාවක් ඇඳිය හැක්කේ තුඩක් නැති පැන්සලකින් පමණකි! අපට සක් දෙවිඳු ඇඳිය හැකි වුව ද සක් දෙවිඳුගේ නළලෙහි සරල රේඛාවක් ඇඳිය නොහැකි ය. සක් දෙවිඳු අප මෙන් වයසට නොයන නිසා නළලෙහි රැළි නොවැටෙන නිසා මේ අවශ්‍ය නොවනවා විය හැකි ය. එහෙත් අවශ්‍යතාවයක් ඇති වුව ද සක් දෙවිඳුගේ නළලෙහි මොන රේඛා ඇන්දත් සරල රේඛාවක් ඇඳිය හැකි නොවේ.

සරල රේඛාවක් යනු වියුක්ත සංකල්පයකි. සංයුක්ත සංකල්ප මෙන් ම එය ද මනසේ නිර්මාණයක් වන නමුත්, එහි දී මනසට වෙනත් කිසිම ඉන්ද්‍රියක ආධාරය වක්‍රව හෝ නොලැබෙයි. මනසට සරල රේඛාවක චිත්ත රූපයක් හෝ මවා ගත නොහැකි ය. සරල රේඛා ගැන සිතන විට, කතා කරන විට අපේ සිත්වල චිත්ත රූප මැවෙන බව සැබෑ ය. එහෙත් ඒ සරල රේඛාවක චිත්ත රූප නොව අප පැන්සලෙන් අඳින මොනවාදෝ රේඛාවල චිත්ත රූප ය. වියුක්ත සංකල්පයක් සම්බන්ධයෙන් ගත් කල එය මනසට හා මනසට පමණක් සීමා වූවක් වෙයි.

© Prof. Nalin De Silva

බටහිර ගණිතය ඉතාමත් වියුක්ත දැනුම් පද්ධතියකි. එහි සෑම සංකල්පයක් ම පාහේ වියුක්ත ය. අප ඇතැම් විට බටහිර ගණිතයෙහි දී ද කල්පනා කිරීමෙහි දී චිත්ත රූප මවා ගන්නවා විය හැකි ය. සරල රේඛා සම්බන්ධයෙන් අපි සිහින් පැන්සල් තුඩුවලින් අඳින සරල රේඛා අපේ පහසුව සඳහා යොදා ගන්නෙමු. එහෙත් අප සෑම විට ම එසේ චිත්ත රූප මවා ගන්නා අවස්ථාවල දී ඉතාමත් ප්‍රවේසම්කාරී විය යුතු වන්නේ එමගින් වැරදි දිශාවකට අප යොමු කිරීමට ඉඩ ඇති බැවිනි.

වියුක්ත සංකල්පයකට තවත් උදාහරණයක් වන්නේ සංඛ්‍යාව ය. සංඛ්‍යාවක් යනු කුමක් දැයි අපි දන්නේ යැයි සිතමු. එහෙත් එය එසේ නොවේ. කුලක වාදය යොදා ගනිමින් සංඛ්‍යා නිර්වචන කරන ආකාරය බටහිර ගණිතයෙහි දැක්වෙයි. අප ඉන් තරමක් මෑත් වී සංඛ්‍යාවක් යනු කුමක් දැයි තේරුම් ගැනීමට උත්සාහ කරමු. හතර යන සංඛ්‍යාවෙන් අප අදහස් කරන්නේ කුමක් ද? හතර කී විගස අපට 4 ඉලක්කම මතක් විය හැකි ය. එහෙත් 4 යනු හතර යන සංඛ්‍යාව සඳහා වූ සංකේතයක් මිස සංඛ්‍යාව නොවේ. හතර යන සංඛ්‍යාව රෝම සංකේත මගින් වෙනත් ආකාරයකට ලියැවෙන බව අපි දනිමු. හතර කී විට ඇතැමකුට ළමයින් හතර දෙනකු හෝ පොල් ගෙඩි හතරක් මතක් විය හැකි ය. එහෙත් ළමයින් හතරදෙනා හෝ පොල්ගෙඩි හතර හෝ යනු චිත්ත රූප මවා ගත හැකි සංයුක්ත සංකල්ප වෙයි. මෙවැනි හතරේ ගොඩවල් රාශියක් අපට සිතා ගත හැකි ය. හතර සංඛ්‍යාව යනු මේ හතරේ ගොඩවල් රාශියට ම ඇති පොදු ගුණය වෙයි. ඒ ගුණය චිත්ත රූපයක් හරහා ඇඳ ගත හැක්කක් නොවේ. පොල් ගෙඩි හතරක් හෝ ඔළු ගෙඩි හතරක් මෙන් හතර සංඛ්‍යාව චිත්ත රූපයක් මගින් දැන ගත හැකි නොවේ. එහෙත් බටහිර ගණිතඥයන් නොවන අපට එය ප්‍රශ්නයක් නොවේ. සරල රේඛාව සම්බන්ධයෙන් මෙන් ම අපි හතර සංඛ්‍යාව සම්බන්ධයෙන් ද සංයුක්ත ව චිත්ත රූප මවා ගනිමු. එහෙත් එය එතරම් හොඳ වැඩක් නම් නොවේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva